කර්මාන්ත අමාත්‍යාංශය

**කාර්මික තාක්ෂණ ආයතනය**

363, බෞද්ධාලෝක මාවත, කොළඹ - 7


# අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා ඇබෑර්තුව

කාර්මික තාක්ෂණ ආයතනය (ITI) [(කලින් ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය (CISIR)] කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන, පර්යේෂණ හා සංවර්ධනය, කොන්ත්‍රාත්තුමය පැවරීම්, උපදේශන, අභ්‍යාස හා තාක්ෂණ සේවාවන් මගින් කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා කැපවූ ශ්‍රී ලංකාවේ බහුශික්ෂිත පර්යේෂණ ආයතනයකි.

ආයතනයේ, අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී තනතුර හෙබවීම සඳහා උද්යෝගී, ජවසම්පන්න, බුද්ධිය හා ධෛර්යය සපිරි විද්‍යාඥයකු හෝ ඉංජිනේරුවරයකු බඳවා ගැනීමට බලාපොරොත්තුවේ. අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක ධූරය ආයතනයේ ඉහළම තනතුර වන අතර, ඔහු / ඇය සෘජුව ආයතනයේ කළමනාකරණ මණ්ඩලයට වාර්තා කළ යුතුය.

මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුත් හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. ඔහු / ඇය විශිෂ්ට චරිතයකින් හෙබි හා පහත දැක්වෙන අවම සුදුසුකම් හා පළපුරුද්ද සහිත අය විය යුතුය.

**භාහිර අයදුම්කරුවන්**

**සුදුසුකම් හා පළපුරුද්ද.**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් වසර හතරක (04) කාලයක විද්‍යාව / ඉංජිනේරු ශිල්පය පිළිබඳ ප්‍රථම උපාධියක් 1 වන හෝ 2 වන පංති පෙළ සමග

   සහ

   අදාළ විශේෂීකරණ ක්ෂේත්‍රයක PhD උපාධිය

   සහ

   ප්‍රථම උපාධියෙන් පසු පිළිගත් ආයතනයක වසර අටක (08) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සහ වසර පහක (05) පශ්චාත් Phd උපාධි පළපුරුද්ද ඇතුළුව පිළිගත් ආයතනයක වසර විස්සක (20) පළපුරුද්ද සහ ප්‍රකාශන, පේටන්ට්, තාක්ෂණ සංවර්ධනය හා පැවරුම් ඇතුළත් පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ප්‍රබල අතීත දක්ෂතා වාර්තා

   හෝ

2. වසර හතරක (04) කාලයක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ප්‍රථම උපාධිය 1 වන හෝ 2 වන පංති පෙළ සමග

   සහ

   ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය පිළිගත් වෘත්තීය මණ්ඩලයක ආයතනික සාමාජිකත්වය (වරපත)

   සහ

   ප්‍රථම උපාධියෙන් පසු පිළිගත් ආයතනයක වසර අටක (08) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සහ වසර පහක (05) පශ්චාත් PhD උපාධි පළපුරුද්ද ඇතුළුව වසර විස්සක (20) පළපුරුද්ද සහ ප්‍රකාශන, පේටන්ට්, තාක්ෂණ සංවර්ධනය හා පැවරුම් සහ පැවරුම් පිළිබඳ ප්‍රබල අතීත දක්ෂතා වාර්තා.

   **වයස :** ඔහු / ඇය අවුරුදු 40 ට නොඅඩු විය යුතුය. අධ්‍යක්ෂ ජනරාල් ඔහු / ඇය කලින් තනතුර හැර ගියහොත් හෝ 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 27(5) වගන්තිය යටතේ තනතුරින් ඉවත් කළහොත් හෝ වසර පහක (05) කාලයක් සඳහා හෝ ඔහු / ඇය වයස අවුරුදු හැට (60) සම්පූර්ණ කරන තෙක් හෝ (පළමුව සිද්ධ වන කුමන හෝ අවස්ථානුකූලව) තනතුර හොබවනු ඇත.

**රැකියා විස්තරය :**

1. බහු ශික්ෂිත විද්‍යාඥ හා තාක්ෂණඥ කණ්ඩායමකට නායකත්වය දී අභිප්‍රේරණය කරමින් පාලනය කිරීම.
2. එහි දැක්ම, මෙහෙවර හා ඉලක්ක ජයග්‍රහණය කිරීමේ බලාපොරොත්තුව සහිතව දේශීය හා විදේශීය ආයතනයන්හි පූර්ණ සහයෝගය ලබා ගනු පිණිස එම ආයතනයන්හි විශ්වාසය උත්පාදනය කිරීම.
3. දේශයේ වර්තමාන හා අනාගත අවශ්‍යතාවයන් හඳුනාගනිමින්, ඉල්ලුම හඹා යන පර්යේෂණ හා සංවර්ධන R&D සහ තාක්ෂණික සේවා ලබා දීම මගින් ඵලදායිතාව තීව්‍රකරලීමට හා ආදායම වැඩිකරලීමට සැලැසුම් සකස් කිරීම හා කාර්යයන් මෙහෙයවීම.
4. කර්මාන්තයට ලබා දෙන සේවාවන්හි තත්ත්වය සහතික කරලීමට ජාත්‍යන්තර පිළිගත් තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපනය කොට තඩත්තු කිරීම.
5. ආයතනයේ සමස්ත පරිපාලන හා මූල්‍ය පාලනය
6. ප්‍රතිපත්තිමය කරුණු මත අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම.
7. විවිධ කාර්යාලීය / නිල වාර්තා හා ප්‍රකාශන පිළියෙල කිරීම.
8. පිරිස් කාර්යසාධනය ඇගැයීම.
9. අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පවරනු ලබන වෙනත් රාජකාරී ඉටුකිරීම.

වැටුප් පරිමාණය : HM 2-3 රු. 98,215 - 12X2,700 - 130,615/-

**වෙනත් ප්‍රතිලාභ**

තෝරාගනු ලබන අයදුම්කරුට කාර්යාලීය මෙන්ම පෞද්ගලික පරිහරණය සඳහා නිලරථයක් සහ නිවසේදී හා ජංගම දුරකථන පහසුකම් කලින් කලට රජය මගින් පනවනු ලබන වියදම් සීමාවන්ට යටත්ව ලබාදෙනු ඇත. ඔහු හෝ ඇය තනතුරට අදාළ සියලුම රජයේ දීමනාවන්ට ජීවන වියදම් දීමනාව ඇතුළුව හිමිකම් ලබනු ඇත. ආයතනයේ ආර්ථසාධක අරමුදල් යෝජනාක්‍රමය ආයතනය මගින්ම ක්‍රියාත්මක කරන අතර, ඒ සඳහා සේවකයින් දළ වැටුපින් 10% කින් සහ ආයතනය 15% කින් දායක වනු ඇත. වැටුපින් තවත් 3% ක් සේවයා විසින් සේවක භාරකාර අරමුදලට දායක වනු ඇත. ඔහු / ඇය ආයතනය මගින් ක්‍රියාත්මක කරන කාර්යසාධනය පදනම් වූ දිරිදීමනා සහ වෙනත් ප්‍රතිලාභ යෝජනා ක්‍රමයන්හිද හිමිකම් ලබයි.

**අයදුම්පත් එවීම සඳහා අවසාන දිනය**

අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග තම සම්පූර්ණ ජීව දත්ත සහිත අයදුම්පත් පහත ලිපිනයේ, සභාපති වෙත 2024-01-21 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

දැනට රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. අයදුම්පතේ පිටපතක් කලින් සෘජුව එවිය හැකිය.

ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ "අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී" යනුවෙන් සඳහන් කළ යුතුය.

මෙම අවශ්‍යතාවයන් හා අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.


**සභාපති, කාර්මික තාක්ෂණ ආයතනය,**
**363, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**

**www.iti.lk**